# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

ඩී. එස්. ෆොන්සේකා පාර, කොළඹ 05, ශ්‍රී ලංකා.
දුරකථන / ෆැක්ස් : 2556629 වෙබ් අඩවිය : www.slpia.lk ඊ-මේල් : slpia@sltnet.lk

මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/බැහැර/50/20 ඔබේ අංකය :

2020.03.01

ගරු ලේකම්තුමා,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
අංක 09 ගොඩනැගිල්ල,
B.M.I.C.H පරිශ්‍රය,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

**<u>උසස්වීම් ලබා දීම පිළිබඳව ස්තූතිය පුදකිරීම.</u>**

දීර්ඝ කාලයක් උසස්වීම් නොලබා සිටි පොලිස් නිලධාරීන් හට උසස්වීම් ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් ඔබ තුමා වෙත ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ හෘදයාංගම ස්තූතිය පිරිනමන්නට කැමැත්තෙමු.

මේ වන විට උප පොලිස් පරීක්ෂක තනතුරේ වසර 08 ක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් හා පොලිස් පරීක්ෂක තනතුරේ වසර 10 ක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් හට උසස්වීම් ලබා දීම සඳහා නියමිත සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන මෙන් හා ප්‍රධාන පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන් සඳහා සහකාර පොලිස් අධිකාරී තනතුරට උසස්වීම් ලබා දීමට අවශ්‍ය කටයුතු ද කඩිනමින් සිදුකර දෙන මෙන් ඔබතුමාගෙන් ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටින්නෙමු.

ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

එස්. සංජය පෙරේරා,
ප්‍රධාන පොලිස් පරීක්ෂක,
සභාපති,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.

ගරු සභාපති
පොලිස් පරීක්ෂක සංගමය

ප්‍රගීත් ප්‍රේමසිරි,
නීතිඥ, නීතිවේදී (ගෞරව),
පොලිස් පරීක්ෂක,
ලේකම්,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.

නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි
නීතිවේදී (ගෞරව)
ගරු ලේකම්
ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය